දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

ඉසුරුපාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල.
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை, பத்தரமுல்லை
"Isurupaya", SriJayawardhanapuraKotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/9/40/1/1/5

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017.08. 16

23 AUG 2017

24 AUG 2017

සාමාන්‍ය පාලන ශාඛාව
25 AUG 2017
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල.

H. Hewage
Additional Secretary
(A & F)

චක්‍රලේඛ අංක : 31/2017

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම රජයේ හා අනුමත පෞද්ගලික/ උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන් හා පාසල් කළමනාකරුවන් හා සාමාන්‍යාධිකාරිවරුන්,
සියලුම පරිවේණාධිපති හිමිවරුන්,

**<u>ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය හා රජය පිළිගත් වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල දේශීය පාඨමාලාවන් හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම.</u>**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ජාතික අධ්‍යාපන ආයතනය හා රජය පිළිගත් වෙනත් තෘතියික අධ්‍යාපන ආයතනවල පාඨමාලාවන් පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව හැදෑරීම සඳහා වැටුප් සහිත අධ්‍යාපන නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති අංක 26/2013 චක්‍රලේඛය පහත පරිදි සංශෝධනය කරමි.

අධ්‍යයන නිවාඩු ලැබීමට සුදුසුකම් ලබන නිලධාරීන් යන්නට අදාළ ඉහත චක්‍රලේඛයෙහි 1.4 වගන්තිය "රජයේ පාසල්, රජයේ අනුමත කරන ලද පිරිවෙන්, පෞද්ගලික පාසල් හා විශේෂ උපකෘත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් හා අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ඒ අයගේ වෘත්තීය අවශ්‍යතාවය අනුව අදාළ පාඨමාලාවන්ට ආයතන සංග්‍රහය අනුව අධ්‍යයන නිවාඩු ලබාගත හැකිය." යනුවෙන් සංශෝධනය කෙරේ.

AO (Admin)
Plo. follow up

එම චක්‍රලේඛයේ 2.5 වගන්තියේ අදාළ අධ්‍යයන නිවාඩු අනුමැතියට යොමු කරන ආකාරය යන්නෙහි "රජය අනුමත කළ පෞද්ගලික පාසල් යන්න" රජය අනුමත කළ පෞද්ගලික පාසල් හා උපකෘත විශේෂ පාසල් යනුවෙන් ද එය නිර්දේශ කිරීමේ බලය පාසල් කළමනාකරු/ සාමාන්‍යාධිකාරි හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද අනුමැතිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන පරිදි ද,

4 ඡේදයෙහි "සති අන්ත පාඨමාලා සඳහා ලබා දෙන රාජකාරි නිවාඩු" යන්නෙහි 4.3 වගන්තිය "පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත), පශ්චාත් උපාධි විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ඩිප්ලෝමාව (සති අන්ත) හදාරනු ලබන, පාසලක සේවය නොකරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට එම පාඨමාලාවේ ප්‍රායෝගික ඉගැන්වීම් අදියර සඳහා සති දහයක (10) අධ්‍යයන නිවාඩුවක් හිමි වේ." යනුවෙන් ද සංශෝධනය විය යුතුය.

එසේම එම චක්‍රලේඛයට අදාළ උප ලේඛනයෙහි,

අංක 2 වගන්තිය, අධ්‍යාපන හෝ අධ්‍යාපන පරිපාලනය පිළිබඳ අධ්‍යාපන දර්ශනපති, අධ්‍යාපනපති, අධ්‍යාපනපති (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) සහ සමාන හෝ එයට ඉහළ මට්ටමේ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා යනුවෙන් ද,

අංක 4 ඡේදයෙහි ප්‍රථම උපාධි පාඨමාලා යන්න යටතේ, 4.1 වගන්තියෙන් අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ජාතික අධ්‍යාපන ආයතනය/විවෘත විශ්වවිද්‍යාලය) හා අධ්‍යාපනවේදී/අධ්‍යාපනපති (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය/අන්තර්කරණ අධ්‍යාපනය) ජාතික අධ්‍යාපන ආයතනය/විවෘත විශ්වවිද්‍යාලය යනුවෙන් ද,

5 ඡේදයෙහි "අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ප්‍රයෝජනවත් වන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා" යන්නෙහි, 5.1 වගන්තිය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා පශ්චාත් උපාධි (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන) ඩිප්ලෝමාව යනුවෙන් ද සංශෝධනය විය යුතුය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත්:**

1. රජයේ අනුමත සියලුම විශ්ව විද්‍යාල හා වෙනත් තෘතියික අධ්‍යාපන ආයතන
2. විගණකාධිපති
3. පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
6. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
8. ගණකාධිකාරිවරුන්
9. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
10. ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්